# කාගිල්ස් අන්තර්ජාල බැංකුකරණය සඳහා වන කොන්දේසි හා නියමයන්

අර්ථදැක්වීම :-

"අන්තර්ජාල බැංකුකරණය" යනු බැංකුවෙහි නිල වෙබ්අඩවිය වන www.cargillsbank.com හරහා ප්‍රවේශ විය හැකි, කාගිල්ස් බැංකු අන්තර්ජාල බැංකුකරණ යෙදුමයි.

මාගේ/අපගේ ඉල්ලීමට/බාගත කරන ලද ඉල්ලුම් පත්‍රයට අනුව, කාගිල්ස් බැංකුව විසින් අන්තර්ජාල බැංකුකරණ පහසුකම් ලබා දී ඇති අතර, මම/අපි මෙහි දක්වා ඇති කොන්දේසි හා නියමයන් වෙත මෙයින් බැඳී සිටිමි/සිටිමු.

1. කාගිල්ස් බැංකුව කාලානුරූපීව අයකරනු ලබන අන්තර්ජාල බැංකුකරණ ගාස්තු ගෙවීම සඳහා මම/අපි වගකියමි/කියමු. මෙම සේවාව සඳහා අදාළ ගාස්තු වෙනස් කිරීමේ හැකියාව බැංකුව සතුය. මාගේ/අපගේ නමින් ඇති ඕනෑම ගිණුමකින් එම අදාළ ගාස්තු අය කර ගැනීමට මම/අපි අවසර ලබා දෙමි/දෙමු.

2. අන්තර්ජාල බැංකුකරණය හරහා මා/අප වෙත නිකුත් කර ඇති රහස්‍ය අංකය මගින් සහතික කරන ලද, බැංකුව වෙත මාගෙන්/ අපගෙන් (මා/අප විසින් ලබා දුන්/නොදුන් හෝ අවසර ලබා දුන්/නොදුන්) ලැබුණු උපදෙස් හෝ පණිවුඩ අනුව ඒවා භාර ගැනීමට හෝ ක්‍රියාත්මක කිරීමට බලය ලබා දෙනු ලබන අතර, එම සියලුම ගනුදෙනු සහ ඉල්ලීම් සඳහා පූර්ණ වගකීම මම/අපි භාර ගනිමි/ගනිමු.

3. කිසිදු හේතුවක් මත මා/අප වෙත ලබාදෙනු ලබන රහස්‍ය අංකයන් කිසිදු තෙවන පාර්ශවයකට අනාවරණය කිරීමට හෝ භාවිතා කිරීමට ලබා නොදියයුතු අතර, එවන් අනවසර පුද්ගලයෙකු වෙත රහස්‍ය අංකයන් ලබා දිය යුතු අවස්ථාවලදී ඒ බව වහාම බැංකුව වෙත මා/අප විසින් දැනුම් දෙනු ඇත. රහස්‍ය අංකයන් යන්නෙන්, අන්තර්ජාල බැංකුකරණ පහසුකම ලබා ගත් අවස්ථාවේදී මා/අප වෙත ලබා දුන් මුල් රහස්‍ය අංකය හෝ මාගේ/අපගේ ඉල්ලීම මත බැංකුව විසින් පසුකාලීනව ජනනය කල හා නිකුත් කරන ලද හා ඉන් පසුව මා/අප විසින් සිදුකරනු ලබන ආදේශන රහස්‍ය අංකයන් අදහස් වේ. නිකුත් කිරීම යන්නෙන්, බැංකුව විසින් ලියාපදිංචි තැපැලෙන් හෝ භාණ්ඩ ප්‍රවාහන සේවය (ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි ශ්‍රී ලාංකිකයන් සඳහා) හරහා හෝ මා/අප විසින් නිසි ලෙස අත්සන් කරන ලද කුවිතාන්සියක් මගින් ලබා දුන් ඉල්ලීමකට අනුව බැංකු නිලධාරින් විසින් පුද්ගලික හඳුනා ගැනීම මත මා/අප වෙත ගෙනවිත් භාර දීමක් (පදිංචිකරුවන් වෙත) අදහස් වේ.

4. සියලුම අවශ්‍යතාවයන් සඳහා බැංකුව විසින් නිකුත් කරනු ලබන ගනුදෙනු වාර්තාවන්, නිශ්චිත හා බැඳී ඇති බවට පිළිගැනීමට මා/අප විසින් එකඟ වේ.

5. මා / අප විසින් සිදු කරන ලද අන්තර්ජාල ගනුදෙනු සම්බන්ධව කිසියම් දෝෂ, විෂමතා හෝ ප්‍රමාද දෝෂයක් පිළිබඳව වහාම බැංකුව දැනුවත් කිරීමට කටයුතු කරන්නෙමි/කරන්නෙමු.

6. මෙම සේවාව භාවිතයෙන් කුමන ආකාරයකින් හෝ බලපානු ලබන අකාරයකට ක්‍රියාත්මක වූ ඕනෑම ගනුදෙනුවක් සඳහා සම්පූර්ණ වගකීම මා/අප විසින් භාරගනු ලැබේ.

7. මා/අප විසින් කරනු ලබන යම් ඉල්ලීම් හෝ ලබා දෙනු ලබන යම් උපදෙස් සම්බන්ධව බැංකුවෙහි බලයලත් නිලධාරියෙකු/නිලධාරීන් ගේ අවසරය අවශ්‍ය වන බවට මා/අප එකඟ වන අතර, එමනිසා එවැනි ඉල්ලීම් හෝ උපදෙස් ක්ෂණිකව හෝ ස්වයංක්‍රියව ක්‍රියාත්මක නොවනු ඇති බවට එකඟ වෙමි/වෙමු. තවද, පෙර දැනුම් දීමක් සහිතව හෝ රහිතව,මා විසින් ලබා දී ඇති සැකසුම් උපදෙස් වෙනස් කිරීම, නතර කිරීම සහ අත්හිටුවීමේ අයිතිය බැංකුව සතු වන බවටද මම/අපි එකඟ වෙමි/වෙමු.

8. යම් ගිණුමක් බද්ධ ගිණුමක් වන අවස්ථාවකදී, අන්තර්ජාල බැංකුකරණය භාවිතයෙන් සිදුකරනු ලබන සියලුම ගනුදෙනු සඳහා, ගිණුම හා සම්බන්ධ සියලුම පාර්ශවයන් සාමුහිකව සහ තනි තනි වශයෙන් වගකිව යුතුය.

9. මා/අප විසින් භාවිතා කරනු ලබන අන්තර්ජාල බැංකුකරණ පහසුකම නිසාවෙන් හා මාගේ/අපගේ ඉල්ලීමට අනුව ප්‍රථම රහස්‍ය අංකය සහ මාගේ/අපගේ ලිඛිත ඉල්ලීමකට අනුව සහ හෝ මා/අප විසින් ලබා දී ඇති ආදේශනයන්ට අනුව මාගේ/අපගේ පරිශීලක හැඳුනුම්පතට අදාළ පසුකාලීනව ලබා දෙන රහස්‍ය අංකයන් උත්පාදනය සහ/හෝ නිකුත් කිරීම සහ/හෝ යැවීම අතරතුරදී දත්ත ඉලෙක්ට්‍රොනිකව ගලායාමේදී සිදුවන දත්ත නැතිවීමක් සහ/හෝ නියමිත මාර්ගයේ ගමන් නොකිරීමක් මගින් සීමාසහිත කාගිල්ස් බැංකුව හට සිදු වනු ඇති, පැවැත්වෙනු ඇති, ඇති වනු ඇති හෝ විඳීමට සිදු වනු ඇති ඕනෑම පාඩුවක්, ගාස්තුවක්, නීති මාලාවක්, හිමිකම් ඉල්ලීමක්, වියදමක් හෝ අලාභයක් යන කරුණු වලින් සීමාසහිත කාගිල්ස් බැංකුව, වෙනස් කල නොහැකි ලෙස වන්දි ගෙවීම් සහ වෙනත් හානි වලින් ආරක්ෂා කර තබන බවට මම/අපි එකඟවෙමි/වෙමු.

10. මා/අප වෙත පෙර දැනුම්දීමක් සහිතව හෝ රහිතව අදාළ පහසුකම අවලංගු කිරිම මගින් ඕනෑම අවස්ථාවකදී මෙම පහසුකම ලබා දීම අවසන් කිරීමේ අයිතිය බැංකුව සතු වේ.

11. ජංගම, ඉතිරිකිරීමේ හෝ වෙනත් ඕනෑම ගිණුමක් ක්‍රියාත්මක කිරීමට අදාළ සියලුම නීති හා රෙගුලාසි අන්තර්ජාල බැංකුකරණ පහසුකම සඳහාද අදාළ වේ.

12. පෙර දැනුම් දීමකින් තොරව ඕනෑම වේලාවකදී ලබා දී ඇති කොන්දේසි හා නියමයන් සහ ගාස්තු හා අයකිරීම් වෙනස් කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු වන බව මෙයින් මම/අපි විසින් වටහා ගනිමි/ගනිමු.

13. අන්තර්ජාල බැංකුකරණ පහසුකම භාවිතා කිරීමට අවශ්‍ය නිසි ක්‍රියාකාරිත්වයකින් සහ එවැනි උපකරණ හෝ අන්තර්ජාල බැංකුකරණ පහසුකම සඳහා ඇති විය හැකි අනර්ථ තර්ජනයන්ගේ බලපෑමෙන් මිදීමට අවශ්‍ය ආරක්ෂාවන් සහිතව ඕනෑම උපකරණයක් ලබා ගැනීම හා නඩත්තු කිරීම මාගේ/අපගේ වගකීම වන බව මම/අපි විසින් පිළිගනිමි/ගනිමු.

14. අන්තර්ජාල බැංකුකරණ පද්ධතිය සෑමවිටම බැංකුව සතු දේපලක්ව පවතිනු ඇති අතර එය වරින් වර නිරීක්ෂණයට ලක්වීමට සහ බැංකුවේ තනි අභිමතය පරිදි නැවත පවරා ගැනීමටද ඉඩ ඇත.

15. යම් තුන් වන පාර්ශවයක් විසින් ලබා දෙනු ලබන භාණ්ඩ හෝ සේවාවන් සඳහා ගෙවීමක් සිදු කල අවස්ථාවකදී, එම භාණ්ඩ හෝ සේවාවන්හි ගුණාත්මකභාවය, නිසි වෙලාවට භාණ්ඩ හෝ සේවාවන් සැපයීම හෝ උපයෝජ්‍යතාවය පිලිබඳ වගකීමට හෝ වගවීමට බැංකුවට නොහැකි මෙන්ම එසේ නොවන බවට මම/අපි එකඟ වෙමි/වෙමු.

16. මෙම ගිවිසුම ශ්‍රී ලංකාවේ නීති රීති වලට අනුකූලව පාලනය වන අතර, ඒ අනුව තේරුම් ගත යුතුය.

17. බැංකුවෙහි අන්තර්ජාල බැංකුකරණ පද්ධතිය හරහා ගනුදෙනුකරුගේ ගිණුම වෙත ඕනෑම නොදන්නා හෝ සැකකටයුතු අනවසර ඇතුළුවීමක් හෝ අනවසර ගනුදෙනුවක් සිදුවුවහොත් ඒ පිලිබඳ වහාම ගනුදෙනුකරු විසින් බැංකුව දැනුවත් කල යුතු අතර එවැනි දැනුම්දීමකදී බැංකුව විසින් එවැනි අනවසර අතුලුවීමක් හෝ ගනුදෙනුවක් සිදු කිරීම මගින් ගනුදෙනුකරුට විය හැකි පාඩු හෝ හානි වලක්වා ගැනීමට අවශ්‍ය පියවර ගනු ඇත. එසේ දැනුම් දුන්නද, පිළිගත හැකි වරදක්/පහරහැරීම එම ගනුදෙනුවෙහි දැකීමට නොහැකි අවස්ථාවකදී, එමගින් ගනුදෙනුකරුට සිදු විය හැකි පාඩුව හෝ අලාභය පිලිබඳ බැංකුව විසින් වගකියනු නොලැබේ.

**කාගිල්ස් බැංකු ජංගම දුරකථන බැංකුකරණ සේවය සඳහා වන කොන්දේසි හා නියමයන්**

අර්ථදැක්වීම -

"ජංගම දුරකථන බැංකුකරණය" යනු ඕනෑම ස්මාර්ට් ජංගම දුරකතනයකට (Android/IOS) හෝ USSD (අව්ධිමත් සේවා දත්ත) ක්‍රමය මගින් සංකේතනය කරන ලද GSM (ජංගම සන්නිවේදනය සඳහා ගෝලීය පද්ධතිය) හරහා ස්මාර්ට් නොවන ජංගම දුරකතනයකට ජංගම දුරකථන බැංකුකරණ යෙදුම බාගතකර ගැනීම (මින් මතුවට Mobile App නමින් හැඳින්වෙන) මගින් හෝ කාගිල්ස් බැංකු ශාඛා නියෝගිතයෙකු හරහා අපගේ සේවාවන් පාරිභෝගිකයන් හට ලබා ගත හැකි කාගිල්ස් බැංකුවෙහි ජංගම දුරකථන බැංකුකරණ සේවාව/පහසුකමයි (Cargills Cashද ඇතුළුව).

"Cargills Cash" සේවාවෙහි මුදල් හුවමාරු කිරීම, බිල්පත් ගෙවීම්,භාණ්ඩ හා සේවා මිලදී ගැනීම්, ශේෂය විමසීම් ඇතුළු තවත් සේවාවන්ද බැංකුවෙහි නියෝජිත ශාඛාවන් හරහා මුදල් තැන්පත් කිරීම හා ආපසු ගැනීම ආදියද ඇතුලත් වේ.

මගේ/අපගේ ඉල්ලීමට /බාගත කරන ලද ඉල්ලුම් පත්‍රයට අනුව සහ හෝ Cargills Cash භාවිතයෙන්, මම/අපි මෙහි දක්වා ඇති කොන්දේසි හා නියමයන් වෙත මෙයින් බැඳී සිටිමි/සිටිමු.

1. කාගිල්ස් බැංකු ජංගම දුරකථන බැංකුකරණ සේවාව මා/අප සඳහා පමණක් බව මම/අපි විසින් පිළිගනිමි/පිළිගනිමු.

2. කිසිදු හේතුවක් මත මා/අප වෙත ලබාදෙනු ලබන රහස්‍ය අංකයන් කිසිදු තෙවන පාර්ශවයකට අනාවරණය කිරීමට හෝ භාවිතා කිරීමට ලබා නොදියයුතු අතර, එවන් අනවසර පුද්ගලයෙකු වෙත රහස්‍ය අංකයන් ලබා දිය යුතු අවස්ථාවලදී ඒ බව වහාම බැංකුව වෙත මා/අප විසින් දැනුම් දෙනු ඇත. රහස්‍ය අංකයන් යන්නෙන්, ජංගම දුරකථන බැංකුකරණ පහසුකම ලබා ගත අවස්ථාවේදී මා/අප වෙත ලබා දුන් මුල් රහස්‍ය අංකය හෝ මාගේ/අපගේ ඉල්ලීම මත බැංකුව විසින් පසුකාලීනව ජනනය කල හා නිකුත් කරන ලද හා ඉන් පසුව මා/අප විසින් සිදුකරනු ලබන ආදේශන රහස්‍ය අංකයන් අදහස් වේ. නිකුත් කිරීම යන්නෙන්, බැංකුව විසින් රහස්‍ය අංකය එවීම හෝ බැංකු නිලධාරින් විසින් පුද්ගලික හඳුනාගැනීම මත මා/අප වෙත ගෙනවිත් භාර දීමක් හෝ මා/අප විසින් නිසි ලෙස අත්සන් කරන ලද කුවිතාන්සියක් මගින් ලබා දුන් ඉල්ලීමකට අනුව තුන්වන පාර්ශවයක් වෙත ලබා දීම අදහස් වේ.

3. ජංගම දුරකථන බැංකුකරණ පහසුකම භාවිතා කිරීමට අවශ්‍ය නිසි ක්‍රියාකාරිත්වයකින් සහ එවැනි උපකරණ හෝ Mobile App සඳහා ඇති විය හැකි අනර්ථ තර්ජනයන්ගේ බලපෑමෙන් මිදීමට

අවශ්‍ය ආරක්ෂාවන් සහිතව ඕනෑම උපකරණයක් ලබා ගැනීම හා නඩත්තු කිරීම මාගේ/අපගේ වගකීම වන බව මම/අපි විසින් පිලිගනිමි/ගනිමු.

4. ජංගම දුරකථන බැංකුකරණය භාවිතා කිරීම සඳහා කාලානුරූපීව කාගිල්ස් බැංකුව විසින් නිශ්චිතව දක්වන පරිදි අනුකූල දෘඩාංග සහ මෘදුකාංග හා සුදුසු දත්ත සේවාවක් සමඟ අනුග්‍රාහක ජංගම උපාංගයක් ලබා ගැනීම හා නඩත්තු කිරීම මා/අප සතු වගකීමකි. මාගේ/අපගේ එම ජංගම උපාංගය, ජංගම උපාංග මෙහෙයුම් පද්ධතිය හෝ දත්ත සේවාව, කාගිල්ස් බැංකුවෙහි Mobile App සමග අනුකූල වන බවට බැංකුව විසින් වගනොකියනු ඇති අතර මා/අප හට ජංගම දුරකථන බැංකුකරණ සේවාව භාවිතය සඳහා අවශ්‍ය වන තුන්වන පාර්ශවයන් මගින් ලබා දෙන මෘදුකාංග පිලිබඳ බැංකුව වගකියනු නොලැබේ.

5. මෙම ජංගම යෙදුම (Mobile App) නිර්මාණය කර ඇත්තේ අධාරක ජංගම උපාංගයන්හි ස්ථාපනය කර ඇති Mobile App හරහා මා/අප හට ක්‍රියාකාරකම් නිරීක්ෂණය, මුදල් හුවමාරුව, බිල්පත් ගෙවීම්, කාගිල්ස් බැංකු පාරිභෝගිකයන් නොවන පුද්ගලයන් හට මුදල් යැවීම සහ බැංකු නියෝජිතයන් මගින් මුදල් ආපසු ගැනීම්, සහ වෙළඳ ස්ථානයන්ගෙන් භාණ්ඩ මිලදී ගැනීමට අවස්ථාව ලබා දී ඇති ආකාරයටයි. ජංගම යෙදුම, සේවාවෙහි කොටසක් ලෙස සලකනු ලැබේ.

6. මෙම සේවාව කාගිල්ස් බැංකුවේ තනි අභිමතය පරිදි කාගිල්ස් බැංකු ගනුදෙනුකරුවන් සඳහා ලබා දී ඇති අතර සියලුම කාගිල්ස් බැංකු ගනුදෙනුකරුවන් වෙත අදාළ සේවාව නොලැබෙනු ඇති බව මම/අපි වටහා ගනිමි/ගනිමු.

7. මා / අප විසින් සිදු කරන ලද ගනුදෙනු සම්බන්ධව කිසියම් දෝෂ, විෂමතා හෝ ප්‍රමාද දෝෂයක් පිළිබඳව වහාම බැංකුව දැනුවත් කිරීමට කටයුතු කරන්නෙමි/කරන්නෙමු.

8. ජංගම උපාංගය පරික්ෂා කිරීමකින් තොරව තැබීමත්, Mobile App වෙත ඇතුළු වී ඇති අවස්ථා වලදී වෙනත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත්, ගනුදෙනු සිදු කිරීම අවසන් වූ පසු අදාළ ජංගම යෙදුමෙන් ඉවත් වීමටත් ඇති වගකීම මා/අප සතු වන බව වටහා ගනිමි/ගනිමු.

9. යම් ගිණුමක් බද්ධ ගිණුමක් වන අවස්ථාවකදී, ජංගම දුරකථන බැංකුකරණය භාවිතයෙන් සිදුකරනු ලබන සියලුම ගනුදෙනු සඳහා, ගිණුම හා සම්බන්ධ සියලුම පාර්ශවයන් සාමුහිකව සහ තනි තනි වශයෙන් වගකිව යුතුය.

10. ඕනෑම හේතුවක් මත ප්‍රාථමික ජංගම දුරකථන අංකය වෙනස් වූ අවස්ථාවකදී, ඒ පිළිබඳව බැංකුව වෙත වහාම දැනුම් දීම මා/අප සතු වගකීමක් බව වටහා ගනිමි/ගනිමු.

11. මා/අප විසින් භාවිතා කරනු ලබන ජංගම දුරකථන බැංකුකරණ පහසුකම නිසාවෙන් හා මාගේ/අපගේ ඉල්ලීමට අනුව ප්‍රථම රහස්‍ය අංකය සහ මාගේ/අපගේ ලිඛිත ඉල්ලීමකට අනුව සහ හෝ මා/අප විසින් ලබා දී ඇති ආදේශණයන්ට අනුව මාගේ/අපගේ පරිශීලක හැඳුනුම්පතට අදාළ පසුකාලීනව ලබා දෙන රහස්‍ය අංකයන් උත්පාදනය සහ/හෝ නිකුත් කිරීම සහ/හෝ යැවීම අතරතුරදී දත්ත ඉලෙක්ට්‍රොනිකව ගලායාමේදී සිදුවන දත්ත නැතිවීමක් සහ/හෝ නියමිත මාර්ගයේ ගමන් නොකිරීමක් මගින් සීමාසහිත කාගිල්ස් බැංකුවහට සිදු වනු ඇති, පැවැත්වෙනු ඇති, ඇති වනු ඇති හෝ විඳීමට සිදු වනු ඇති ඕනෑම පාඩුවක්, ගාස්තුවක්, නීති මාලාවක්, හිමිකම් ඉල්ලීමක්, වියදමක් හෝ අලාභයක් යන කරුණු වලින් සීමාසහිත කාගිල්ස් බැංකුව, වෙනස් කල නොහැකි ලෙස වන්දි ගෙවීම් සහ වෙනත් හානි වලින් ආරක්ෂා කර තබන බවට මම/අපි එකඟවෙමි/වෙමු.

12. කාගිල්ස් බැංකු නියෝජිත ශාඛාවන්හි මාගේ/අපගේ ජංගම දුරකථන අංකය, ගිණුම් අංකය, සහ ජාතික හැඳුනුම්පත් අංකය භාවිතයෙන් සිදුකරනු ලබන සියලුම ගනුදෙනු සඳහා මම/අපි සම්පූර්ණයෙන් වගකීමට එකඟ වෙමි/වෙමු.

13. ජංගම, ඉතිරිකිරීමේ හෝ වෙනත් ඕනෑම ගිණුමක් ක්‍රියාත්මක කිරීමට අදාළ සියලුම නීති හා රෙගුලාසි සහ කොන්දේසි හා නියමයන්, ජංගම දුරකථන බැංකුකරණ පහසුකම සඳහාද අදාළ වේ.

14. පෙර දැනුම් දීමකින් තොරව ඕනෑම වේලාවකදී ලබා දී ඇති කොන්දේසි හා නියමයන් සහ ගාස්තු හා අයකිරීම් වෙනස් කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු වන බව මෙයින් මම/අපි විසින් වටහා ගනිමි/ගනිමු. එමෙන්ම මෙම සේවාවෙහි යම් යම් කොටස් වෙනස් කිරීමට, මාරු කිරීමට, එකතු කිරීමට, ඉවත් කිරීමට ඇති අයිතිය, බැංකුවේ තනි අභිමතය පරිදි ඔවුන්ට හිමිවේ.

15. යම් තුන් වන පාර්ශවයක් විසින් ලබා දෙනු ලබන භාණ්ඩ හෝ සේවාවන් සඳහා ගෙවීමක් සිදු කල අවස්ථාවකදී, එම භාණ්ඩ හෝ සේවාවන්හි ගුණාත්මකභාවය, නිසි වෙලාවට භාණ්ඩ හෝ සේවාන් සැපයීම හෝ උපයෝජ්‍යතාවය පිලිබඳ වගකීමට හෝ වගවීමට බැංකුවට නොහැකි මෙන්ම එසේ නොවන බව මම/අපි එකඟ වෙමි/වෙමු.

16. ඕනෑම අවස්ථාවකදී බැංකුවේ තනි අභිමතය පරිදි,මෙම සේවාවෙහි ලක්ෂණයන් අවසන් කිරීම,වෙනස් කිරීම, එකතු කිරීම සහ ඉවත් කිරීම ආදියෙහි අයිතිය බැංකුව සතුය. එවැනි වෙනස්වීම් පිළිබඳව බැංකුව විසින් එක් මාධ්‍යකින් හෝ මාධ්‍යන් කිහිපයකින් මා/අප වෙත දැනුම් දෙනු ඇත. එසේ කාගිල්ස් බැංකු ජංගම දුරකථන බැංකුකරණ සේවාව සඳහා සිදුකරනු ලැබූ

ලක්ෂණයන් අවසන් කිරීම,වෙනස් කිරීම, එකතු කිරීම සහ ඉවත් කිරීම ආදියෙන් පසුවද මා/අප විසින් එම සේවාව භාවිතා කිරීම මගින්, එවැනි වෙනස්වීම් පිළිගත් හා එකඟ වූ බවට සලකනු ලැබේ.

17. මෙම ජංගම දුරකථන යෙදුම භාවිතයේදී තාක්ෂණික හෝ වෙනත් ගැටළු පැනනැගිය හැක. එවැනි දුෂ්කරතා හෝ එමගින් මට/අපට සිදුවන හානි සම්බන්ධයෙන් බැංකුව වගකීම භාර නොගනී. ආරක්ෂිත හේතූන් මත ජංගම දුරකථන යෙදුම සඳහා සුදුසුකම් අවශ්‍යතා දක්වා ඇති අතර එම සුදුසුකම්, ඕනෑම අවස්ථාවකදී පෙර දැනුම්දීමකින් තොරව වෙනස් කිරීම පූර්ණ අයිතිය බැංකුව සතු වේ. මෙම සේවාව සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් හෝ මාගේ/අපගේ ජංගම දුරකථන බැංකුකරණ සේවා භාවිතය පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් මාහට/අපහට පෙර දැනුම් දීමකින් තොරව ක්ෂණිකව වෙනස් කිරීමට, අත්හිටුවීමට හෝ නතර කිරීමට සම්පූර්ණ අයිතිය බැංකුව සතු වේ.මා/ අප මෙම සේවාව වෙත පිවිසීම සඳහා භාවිතා කරන ජංගම උපකරණ සංඛ්‍යාව සීමා කිරීමේ අයිතියද බැංකුව සතුය.

18. (අ) ජංගම දුරකථන බැංකුකරණය සඳහා මා/අප විසින් යොදාගනු ලබන මාගේ/අපගේ ජංගම උපකරණයෙහි ප්‍රවේශ වීමේ අංකය(අංක), රහස්‍ය අංකය(අංක), ආරක්ෂිත ප්‍රශ්නය (ප්‍රශ්න) හා පිළිතුර (පිළිතුරු), ගිණුම් අංකය(අංක), ප්‍රවේශ වීමේ (login) තොරතුරු හෝ වෙනත් ඕනෑම ආරක්ෂක තොරතුරු හෝ ඇතුළු වීමේ තොරතුරු (සාමූහිකව ගත කල "ප්‍රවේශ තොරතුරු") වල රහස්‍යභාවය හා ආරක්ෂාව පවත්වාගෙන යාම සහ (ආ) ජංගම දුරකථන බැංකුකරණය සමග මා/අප භාවිතා කරන, ගබඩා කරන හෝ සම්ප්‍රේෂණය කරන තොරතුරු, ලිපිගොනු හෝ දත්ත වෙත අනවසරයෙන් ප්‍රවේශ වීම හෝ භාවිතා කිරීම වැලැක්වීම සඳහා මාගේ/අපගේ ප්‍රවේශ තොරතුරු කිසිවකු වෙත ලබා නොදීමට එකඟ වෙමි/වෙමු. ප්‍රවේශවීමේ තොරතුරු භාවිතයෙන් ඇතුලත් කරන ලද රූප සම්ප්‍රේෂණ, විද්‍යුත් තැපැල් හෝ වෙනත් දත්ත ("සන්නිවේදන") ඇතුළු සියලුම විද්‍යුත් සන්නිවේදනයන්ට මම/අපි වගකියමි/කියමු. ප්‍රවේශ තොරතුරු භාවිත කිරීම හරහා ලැබී ඇති සන්නිවේදනයන්, මා/අප විසින් එවනු ලැබූ හෝ බලය පවරනු ලැබූ බවටත් බැංකුව සමග ඇති මාගේ/අපගේ ගිණුමට හර කරන ලෙසටත් සලකනු ඇත. මාගේ/අපගේ ජංගම උපකරණ ඇතුළුව ඕනෑම ප්‍රවේශ වීමේ තොරතුරක් නැතිවූ, සොරකම්කළ හෝ අනවසර භාවිතයක් සිදුවූ අවස්ථාවකදී, ක්ෂණිකව ඒ බව බැංකුව වෙත දැනුම්දීමට එකඟ වෙමි/වෙමු. ප්‍රවේශ වීමේ තොරතුරක් නැතිවූ, සොරකම්කළ හෝ අනවසර භාවිතයක් සිදුවී ඇති බවට බැංකුව විශ්වාස කරන අවස්ථාවකදී ජංගම දුරකථන බැංකුකරණ සේවාවට (හෝ එහි කොටසක් වෙත) මා/අප හට ප්‍රවේශ වීමේ හැකියාව නතර කිරීමේ අයිතිය බැංකුව සතුය.

19. ජංගම දුරකථන බැංකුකරණය භාවිතයෙන් සිදුකරනු ලබන ගනුදෙනුවල වටිනාකමෙහි (වටිනාකම්වල) සහ/හෝ සිදුකරන ගනුදෙනු සංඛ්‍යාවෙහි (බැංකුව විසින් පනවන යම් කාල

සීමාවක් සඳහා) සීමාවන් පැනවීමට සහ එම සීමාවන් කලින් කලට වෙනස් කිරීමේ අයිතිය බැංකුව සතු වේ. මෙම සීමාවන්ගෙන් බැහැරව මා/අප විසින් යම් ගනුදෙනුවක් සිදුකිරීමට උත්සාහ කරන අවස්ථාවකදී, බැංකුව විසින් මාගේ/අපගේ එම ගනුදෙනුව ප්‍රතික්ෂේප කරනු ඇත. මෙම සීමාවෙන් බැහැරව ගනුදෙනුවක් සිදුකිරීමට මා/අප වෙත බැංකුව විසින් අවසර දුන් අවස්ථාවකදී, එම ගනුදෙනු, මෙම කොන්දේසි හා නියමයන්ට යටත් වනු ඇති අතර එසේ අවස්ථාව ලබා දීම මගින්, තවත් අවස්ථාවකදී එම අවසරය ලබා දීමට බැංකුව බැඳී සිටින බව අදහස් නොවේ.

20. ජංගම උපාංගය බැහැර කරන හෝ මාරු කරන අවස්ථාවලදී, අනවසර ඇතුළුවීම් වැලැක්වීම සඳහා ජංගම දුරකථන බැංකුකරණ යෙදුම (Mobile App) එම උපාංගයෙන් ඉවත් කිරීමේ වගකීම මා/අප සතු වේ.

21. ජංගම දුරකථන බැංකුකරණය සමග සිදුකරනු ලබන ගනුදෙනු හා සම්බන්ධ ඕනෑම පැමිණිල්ලක් සහ/හෝ මතභේදයක් ඇත්නම් පහත සඳහන් මාර්ගයන්ගෙන් බැංකුව වෙත දැනුම් දිය හැකි බව මම/අපි විසින් වටහා ගනිමි/ගනිමු.

    දුරකථන : 011 7640 000

    ෆැක්ස් : 011 7640 215

    විද්‍යුත් තැපැල : customersupport@cargillsBank.com

    තැපැල : අංක 696, ගාලු පාර, කොළඹ 03.

22. මෙහි දක්වා ඇති කලින් කලට වෙනස් විය හැකි කොන්දේසි හා නියමයන් මා/අප හෝ මාගේ/අපගේ අනුප්‍රාප්තිකයන්, උරුමක්කරුවන්, විධායකයන්, පරිපාලකයන් හෝ අවසර ලත් පැවරුම්ලාභීන් සමග අවස්ථානුකූලව බැඳී පවතිනු ඇත.

23. ඕනෑම හේතුවක්මත දෙපාර්ශවයෙන් එක අයෙකුගේ අභිමතය පරිදි අවසන් කරන තුරු මෙම සේවාව පූර්ණ බලයෙන් යුතුව පවතිනු ඇත. මා/අප විසින් මෙම සේවාව, යම් අනවසර හෝ නීත්‍යානුකූල නොවන කටයුත්තක් සඳහා හෝ මා/අප විසින් එකඟ වී ඇති මෙම කොන්දේසි හා නියමයන්ට පටහැනි වන අකාරයකට භාවිතා කරයි නම්, අදාළ සේවාව අවසන් කිරීමේ පූර්ණ බලතල බැංකුව සතු වන බව මම/අපි විසින් වටහා ගනිමි/ගනිමු.

24. ජංගම දුරකථන බැංකුකරණ සේවාව හා ජංගම දුරකථන යෙදුම (Mobile App) සියලු කාලයන්හිදී බැංකුව සතු දේපලක්ව පවතිනු ඇත. මෙම සේවාව කාලනුරූපීව නිරීක්ෂණයට ලක්වනු ඇති අතර බැංකුවේ තනි අභිමතය පරිදි අදාළ සේවාව ඉවත් කර ගැනීමටද හැකියාව ඇත.